**ශීර්ෂය 261 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල**

**----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6.1(ඈ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් සිදුකරන ලද නිර්දේශයන් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.261,001 ක් වූ වෙනත් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 2019 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | සියළුම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඇතුළත් කර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය සමඟ සැසඳිය යුතුය. | දේපළ පිරියත උපකරණ වටිනාකම සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමේදී අයිතම කිහිපයක් වැරදියට සටහන් කිරීම නිසා මෙය සිදුවී ඇති බව සඳහන් කර තිබුණි. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ඒසීඒ - 6 ආකෘතියෙහි වත්කම් විකිණීම් ලෙස රු.4,633,149 ක ශේෂයක් දක්වා තිබුණි. එම ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයන් යටතේ වත්කම් විකිණීමක් ලෙස සටහන් කර නොතිබුණි. | වත්කම් විකිණීමෙන් ලද මුදල්, මුදල් ප්‍රවාහයන් යටතේ දැක්විය යුතුය. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 ප්‍රකාරව අපහරණය කරන ලද වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම වෙනත් ආදායම් යටතේ ඇතුළත් කර ඇති බව දක්වා තිබුණි. |

**1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------------------------ |
| (i) 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කින් විශ්‍රාම ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,407,490 ක ණය ශේෂයක් පැවැති අතර එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.101,628 ක ණය ශේෂය වසර 06 ක කාලයක සිට හිඟහිටිව පැවතුණි. | නිලධාරීන් විශ්‍රාමගැන්වීමට පෙර ඔවුන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කල යුතු වීම. | විශ්‍රාම ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.1,407,490 ක ණය ශේෂයන් තවදුරටත් අයවිය යුතුව ඇති බව දන්වා තිබුණි. |
| (ii) 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක වැඩ තහනම් කර තිබුණු නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.258,444 ක ණය ශේෂයක් පැවැති අතර ඉන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.151,898 ක ණය ශේෂය වසර 03 කට ආසන්න කාලයක් හිඟහිටිව පැවතුණි. | ඇපකරුවන්ගෙන් ණය ශේෂය අය කර ගැනීමට කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට රු.258,444 ක් වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතුව තිබුණු බවත්, ඉන් රු.247,944 ක ණය ශේෂයක් තවදුරටත් අයවිය යුතුව ඇති බව දන්වා තිබුණි. |
| (iii)2019 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතුව සිට සේවය හැරගිය සංවර්ධන නිලධාරිකුගෙන් අයවිය යුතු රු.164,129 ක ණය ශේෂය වසර 03 ක කාලයක සිට හිඟහිටිව පැවතුණි. | අදාළ නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂය අය කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. | ඇපකරු මියගොස් ඇතිබැවින් නිලධාරියාගේ භාර්යාවගේ වැටුපෙන් ගෙවීමට කැමැත්ත පලකර ඇති බවත්, දැනට පවතින ශේෂය රු.156,419 ක් බවත් දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (iv)ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අනුයුක්තව සිට මිය ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.773,108 ක ණය ශේෂයක් 2019 දෙසැම්බර් 31 දිනට නිරවුල් කළ යුතු වුවද, එම ණය ශේෂයන්ගෙන් රු.22,935 ක ශේෂයක් වසර 02 කට ආසන්න කාලයක සිට නිරවුල් නොවී පැවතුණි. | නිරවුල් කළ යුතු ණය ශේෂ කඩිනමින් පියවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට පැවති ණය ශේෂයෙන් රු.498,942 ක ශේෂයක් අය කරගෙන ඇති බවත් රු.274,166 ක ණය ශේෂයක් තවදුරටත් අයකිරීමට ඇති බවත් දන්වා තිබුණි. |

**1.6.4 අග්‍රිම ශේෂය**

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2006 වර්ෂයේ සිදු වී තිබුණු චෙක්පත් වංචාවක් හේතුවෙන් අග්‍රිම ගිණුමෙහි දැක්වෙන රු.194,086 ක් වූ නොපියවූ අග්‍රිම ශේෂය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට වසර 13 කට අධික කාලයක සිට ප්‍රමාද වී තිබුණි. | නොපියවූ අග්‍රිම ශේෂය කඩිනමින් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | භාණ්ඩාගාරයේ තදෝචිත අත්තිකාරම් ගිණුමෙන් මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇති බව දන්වා තිබුණු අතර තවද මේ වන විට බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ මේ සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් ඇති බවත් දන්වා තිබුණි. |
| (ii) සමාලෝචිත වර්ෂය අවසානයේ නොපියවූ මැතිවරණ අත්තිකාරම් මුදල රු.8,936,294 ක් විය. | අදාළ පාර්ශවයෙන් කඩිනමින් මුදල් අයකර අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. | මේ වන විට අත්තිකාරම් ශේෂය රු.2,575,234 ක් බවත් මැතිවරණ මහලේකම් කාර්යාලයෙන් මුදල් ලැබෙන පරිදි පියවීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. |

**1.6.5 ලේඛන පවත්වා නොතිබීම**

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව සෑම රජයේ ආයතනයක් විසින්ම ආයතනය සතු වාහන පිළිබඳව වාහන අංකය, වැසි අංකය, එන්ජින් අංකය, අශ්ව බලය, ඉන්ධන වර්ගය වාහන වර්ගය, මාදිලිය, මිලට ගන්නා ලද්දේ නම් මිලදී ගත් දිනය, ගෙවූ මුදල, ගෙවූ දිනය, ආරක්ෂණ සහතිකය පිළිබඳ විස්තර ඇතුලත් විධිමත් වාහන ලේඛනයක් නඩත්තු කළ යුතු වුවත් එවැනි තොරතුරු අඩංගු විධිමත් ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් වාහන ලේඛනයක් නඩත්තු කිරීමට කඩිනමින් පියවර යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයට අදාළ තොරතුරු ඇතුළත් ලේඛනයක් මේ වන විටත් පවත්වාගෙන යනු ලබන බවත් අදාළ මුදල් රෙගුලාසිවල ඇතුළත් තොරතුරුද පදනම් කර ගනිමින් විධිමත් තොරතුරු ඇතුලත් ලේඛනයක් ඉදිරියේදී නඩත්තු කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. |

**1.6.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්, මුදල් නිදහස් කර තිබුණද ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති හා කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති සම්බන්ධයෙන් තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු කඩිනමින් ලබා දීමට පියවර ගත යුතුය. | 2020 මැයි 29 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ලබා දී ඇති බව දන්වා තිබුණි. |

## 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | ආයතන සංග්‍රහයේ II කොටසේ XLVII පරිච්ඡේදයේ 1.6 ඡේදය | කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගල්වඩුගොඩ ග්‍රාම නිලධාරී වසමේ වැඩබලන ලද ග්‍රාම නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් වලට අනුකූල නොවන පරිදි 2018 සැප්තැම්බර් 11 දින සිට 2019 මැයි 24 දින දක්වා එම වසමේ රාජකාරි නීත්‍යානුකූල නොවන අයුරින් ඉටු කිරීම සම්බන්ධයෙන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විධිමත් විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර එම තීරණ ක්‍රියාත්මක කළ යුතුය. | ග්‍රාම නිලධාරීවරයා සම්බන්ධයෙන් සිදු කළ 2019 දෙසැම්බර් 02 දිනැති මූලික විමර්ශණ වාර්තාව අනුව 2020 පෙබරවාරි 17 දින ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ I වන උපලේඛනය යටතේ චෝදනා 25ක් යටතේ චෝදනා ගොනු කර චෝදනා පත්‍ර නිකුත් කර ඇති බවත් මේ වනවිට විධිමත් විනය පරීක්ෂණයක් සඳහා ඒක පුද්ගල විනිශ්චය සභාවක් හා පැමිණිල්ල මෙහෙයවන නිලධාරි පත් කර ඇති බවත් චූදිතගේ ඉල්ලීම අනුව රැකවරණ නිලධාරි සඳහා ද අනුමැතිය ලබා දී ඇති බවද දන්වා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------ | | | |
| | මුදල් රෙගුලාසි 104(4) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාළව සිදුවී තිබුණු වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාළ එම රථ අනතුරු සම්බන්ධයෙන් තව දුරටත් ලැබිය යුතු මුදල සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් ලැබී නොමැති බැවින් වාහන අනතුරු 06ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) පරිදි අලාභයන් පිළිබඳ අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ නොහැකිව තිබුණු බවත් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සිහිකැඳවීම් සිදුකර තොරතුරු විමසා ගොනුවල කටයුතු සිදු කරන බවද දන්වා තිබුණි. |
| (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ට අදාළව 2011 මාර්තු 09 දින නිකුත් කර තිබුණු අතිරේකය | ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය අනුව පිරිනමා තිබූ කොන්ත්‍රාත්වල ඉතිරි වැඩ කොටස්වල මුළු වටිනාකම සහ යෝජිත කොන්ත්‍රාත්වල වටිනාකමෙහි එකතුව රු.මිලියන 2 නොඉක්මවිය යුතු වුවද ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ව්‍යාපෘති සඳහා ගිවිසුම්ගත වීමට සමිති තෝරා ගැනීමේදී අදාළ චක්‍රලේක වලට අනුකූලව කටයුතු කරන බවත් දන්වා තිබුණි. |

අයත් නිල සෙවණ ගොඩනැගිලි ඉදි කිරීමේ කොන්ත්‍රාත්කරුට එකවර කොන්ත්‍රාත් තුනක් පිරිනමා තිබුණු අතර මුළු ගිවිසුම්ගත මුදල රු.මිලියන 3.9 ක් වී තිබුණි.

### 1.6.8 අවිධිමත් ගනුදෙනු

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගාල්ල බද්දේගම 187 පිලගොඩ ග්‍රාම නිලධාරී වසමේ පවත්වාගෙන ගිය ගල්කොරිය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් ලබා දී තිබුණු අංක IML/B/HO/11128 දරන කැනීම් බලපත්‍රයේ වලංගු කාලය 2018 ඔක්තෝබර් 19 වන දිනෙන් අවසන් වි තිබුණි. කැනීම් බලපත්‍රය අලුත් කර ගැනීමෙන් තොරව එදින සිට 2019 ජුනි 09 දින දක්වා කැනීම් කටයුතු පවත්වා තිබුණු අතර, එම කාලය තුළ සිදු කළ පිපුරුම් පරිකෂණ ප්‍රතිඵල මත ලබා දුන් විශේෂ කොන්දේසි අංක 17 යටතේ මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා ගත යුතු පරිසර බලපත්‍රයද ලබා ගෙන නොතිබුණි. තවද ගල්කොරිය පවත්වාගෙන යෑම සඳහා බද්දේගම ප්‍රාදේශීය සභාවෙන් ලබා ගත යුතු වෙළඳ බලපත්‍ර ලබා ගෙන නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු කිසිදු පාර්ශවයක් අධීක්ෂණයක් හෝ ස්ථානීය පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මෙය ගාල්ල දිස්ත්‍රික්කයට අදාළ කරුණක් බැවින් අදාළ අංශ සම්බන්ධීකරණය කර විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. ගල්කොරිය සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතීන් ලබාදෙන ආයතන විසින් බලපත්‍ර නොමැතිව ගල්කොරිය පවත්වාගෙන යාම පිළිබඳව වගකීමකට බැඳේ. | SNP/L/GSMB/2019/01 යන විගණන විමසුම අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කාර්යාංශයට යොමුකර ඇති විගණන විමසුමක් බව දන්වා තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **අග්‍රිම කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ මාසිකව ඉල්ලුම් කළ අග්‍රිම ප්‍රමාණයට වඩා සියයට 11 ත් සියයට 76 ත් අතර ප්‍රතිශතයන්ගෙන් අග්‍රිම අඩුවෙන් ලැබී තිබුණි. | සැලසුම්වලට අනුකූලව අග්‍රිම ඉල්ලුම් කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂයට අමතරව වෙනත් රේඛීය අමාත්‍යාංශවලට අදාළව අග්‍රිම ඉල්ලුම් කරන බවත්, අග්‍රිම නිකුත් කිරීම භාණ්ඩාගාරයෙන් සිදු කරන බැවින් මෙය පාලනය කළ නොහැකි කරුණක් බවත් දන්වා තිබුණි. |
| (ආ) වැය විෂය අංක 2509 සඳහා පරිපූරක ඇස්මේන්තු මගින් රු.1,350,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණ අතර එයින් සමාලෝචිත වර්ෂය අවසානයට දරා තිබූ වියදම් රු.42,480 ක් හෙවත් සියයට 3 ක ප්‍රතිශතයක් පමණි. | පරිපූරක ඇස්තමේන්තුවකින් මුදල් ලබා ගත යුත්තේ ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විටය. අවශ්‍යතාව සලකා බලා පරිපූරක ප්‍රතිපාදන ඉල්ලුම් කර ලබා ගැනීමට වග බලාගත යුතුය. | වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ කටයුතු සඳහා රු.42,480 ක වියදමක් දරා ඇති බවත්, ගිවිසුම්ගත නොවූ සහ වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති නැවත දන්වන තෙක් තාවකාලිකව අත්හිටුවීමට උපදෙස් ලැබී තිබුණු බැවින් ව්‍යාපෘති නතර කර ප්‍රතිපාදන නැවත හරවා යැවීමට කටයුතු කළ බව දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 අප්‍රේල් 08 දිනැති අංක 03/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 05/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2019 වර්ෂයේ රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා 2019 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන් කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 25 ක් ඉතිරි කරන ලෙස දන්වා තිබුණද, දිස්ත්‍රික් ලේකම් වෙත ලැබී තිබුණු සමස්ත ප්‍රතිපාදනවලින් සියයට 37 ක ප්‍රතිශතයක් ඉතිරිකර තිබුණි. | සියයට 25 ඉක්මවා ප්‍රතිපාදන ඉතිරි කිරීම ප්‍රතිපාදන ඌණ උපයෝජනයක් වන අතර සියළුම ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කළ යුතුය. | 2019 සැප්තැම්බර් 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2019 අනුව 2019 වර්ෂයේ ඉතිරි කාල සීමාව තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම යන චක්‍රලේඛය යටතේ ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් සියයට 15 හා සියයට 10 ප්‍රමාණයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අවශ්‍යතාවයන් හඳුනාගෙන තෝරාගත් වැය විෂයයන් කිහිපයකින් ඉතිරි කිරීම් සිදුකර ඇති බව දන්වා තිබුණි. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

බැරකම් හා බැඳීම්වලට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන හා අනෙකුත් ව්‍යාපෘති වෙනුවෙන් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 කට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු අතැති බිල්පත් වටිනාකම රු.903,799,366 ක් වී තිබුණි. මෙම අතැති බිල්පත් වෙනුවෙන් විවිධ වැය ශීර්ෂ යටතේ රු.908,957,993 ක ප්‍රතිපාදන 2020 ජනවාරි 29 දිස්ත්‍රික් ලේකම් විසින් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් ඉල්ලා තිබුණද 2020 පෙබරවාරි වන විටද මෙම ප්‍රතිපාදන ලැබී නොමැති බව නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ අතැති බිල්පත් සඳහා 2019 දෙසැම්බර් 31 දිනට ගෙවීම් කර අවසන් කළ යුතුව තිබුණි. | අතුරු සම්මත ගිණුම මගින් වෙන් වී ඇති ප්‍රතිපාදනවලින් අතැති බිල්පත් ගෙවීම සඳහා 2020 වර්ෂයේ නැවත ප්‍රතිපාදන ගෙන්වාගත යුතුව ඇති බවත් ප්‍රතිපාදන නිදහස් කිරීම සිදු කරන්නේ අදාළ අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව බැවින් එය දිස්ත්‍රික් ලේකම්වරයාට බලපෑම් කළ නොහැකි කරුණක් බවත් දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) ඉහත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව අතැති බිල්පත් වටිනාකමට අමතරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව වැය ශීර්ෂ 155-1-6-3-2104 යටතේ සිදුකරන ශ්‍රවණාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.30,393,751 ක මුදලක්ද ගෙවීමට තිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ ප්‍රතිපාදනවලින් ගෙවිය යුතු බිල් පත්වලට අනුව සහතික කළ වැඩවලට වර්ෂය අවසානයේ ගෙවීමට කටයුතු කළ යුතුය. | ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම හේතුවෙන් 155 වැය ශීර්ෂය යටතේ රු. 30,393,751 ක අතැති බිලක් ඇති බවත් ඒ සඳහා අක් මුදල් නොලැබීම අපගේ පාලනයෙන් තොර කරුණක් බවත් දන්වා තිබුණි. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ප්‍රතිපාදන උපයෝජනය**<br>වෙනත් අමාත්‍යාංශ 23 ක් දෙපාර්තමේන්තු 21 ක් හා එක් කාර්යාලයක් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 6,104.304 ක්, රු. මිලියන 255.061 ක් හා රු. මිලියන 185.108 ක් වශයෙන් එකතුව රු. මිලියන 6,544.473 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.මිලියන 4,760.768 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලද ප්‍රතිපාදන වලින් රු.මිලියන 1,783.705 ක් හෙවත් සියයට 27 ක ප්‍රතිශතයක් ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | වර්ෂය සඳහා ලැබෙන ප්‍රතිපාදන එම වර්ෂය තුළම ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට වග බලා ගත යුතුය. | විගණන නිරීක්ෂණ නිවැරදි බවත් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා එක් කාර්යාලයක් සඳහා 2019 වර්ෂයට ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය නොකිරිමට හේතු වශයෙන් වියදම් කළමනාකරණය කිරීම, ගිවිසුම්ගතවී නොමැති ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවීම, ඇස්තමේන්තුගත වියදමට වඩා බිල්පත් වටිනාකම අඩු වීම, ඇතැම් වැඩසටහන් වර්ෂය තුළ ක්‍රියාත්මක නොවීම වැනි කරුණු දක්වා තිබුණි. |

**(ආ) විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම**

--------------------------------------

| | | |
|---|---|---|
| බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවතින විශ්‍රාම වැටුප් ලිපිගොනු 34 ක 16/2015 විෂමතා තොරතුරු, විශ්‍රාම වැටුප් දීමනා හා වැටුප් වර්ධක අගය, සක්‍රීය සේවා කාලය යන තොරතුරු නොමැති වීම හේතුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2019 පරිදි විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමට නොහැකිවී තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අදාළ ආයතන වෙත මෙම අඩුපාඩු පිළිබඳව වාර්තා කර තිබුණද 2020 මැයි 28 දින වන විටද එම කාර්යයන් අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | කඩිනමින් තොරතුරු ගෙන්වාගෙන විශ්‍රාම වැටුප් විශමතා නිවැරදි කර ගෙවීම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | තව දුරටත් සංශෝධනය කළ යුතු ලිපිගොනු සංඛ්‍යාව 34 ක් බවත් අදාළ ආයතන විසින් තොරතුරු ලද විගස මෙම විශ්‍රාම වැටුප් ලිපිගොනුවල සංශෝධන කටයුතු අවසන් කරන බවද මෙය අපගේ පාලනයෙන් තොර කාරණයක් බවද දන්වා තිබුණි. |

**(ඇ) නිල සෙවන ව්‍යාපෘති පරීක්ෂාව**

-------------------------------------

| | | |
|---|---|---|
| (i) සාධාරණ හේතුන් සඳහන් නොකර අවිධිමත් පරිදි දින දීර්ඝ කර ගෙන තිබුණු ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නිල සෙවන ගොඩනැගිලි ඉදි කිරීම් ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්තුකරුවන්ගෙන් ආසන්න වශයෙන් රු.2,805,154 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් අය කර ගත යුතුව තිබුණි. | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමේදී සාධාරණ හේතු ඉදිරිපත් කළ යුතු අතර එය විධිමත් පරිදි අනුමත කළ යුතුය. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි හා කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නොකඩවා ඇද හැළුනු වර්ෂාව නිසා අදාළ ස්ථානය වෙත අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු කළ නොහැකි වීම සහ 2019 වර්ෂයට අදාළ ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා අවිච්ඡේද අනුමැතිය ලබා දී තිබීම යන කරුණු හේතුවෙන් ප්‍රමාද ගාස්තු අය කිරීම සිදුකර නොමැති බවත් ඉදිරියේදී කල්දිගු ඉල්ලීම් කිරිමට විධිමත් ආකෘතියක් භාවිතා කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) එක් නිල සෙවණ ගොඩනැගිල්ලක් ඉදි කිරීමට යොදා ගෙන තිබුණු භූමිය ප්‍රාදේශීය ලේකම් සතු ඉඩමක් නොවන බව නිරීක්ෂණය විය. ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව මෙම නිල සෙවණ ඉදි කිරීම ආරම්භ කිරීමට පියවර ගෙන තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට රු.37,640 ක මුදලක් නිල සෙවණ ඉදි කිරීමේ මූලික වැඩ කොටස් ඉටු කිරීම වෙනුවෙන් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර 2020 මැයි දක්වාම ඉඩමේ අයිතිය නිරවුල් නොවීම හේතුවෙන් නිල සෙවන ඉදි කිරීමේ කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. | නිල සෙවණ ඉදි කිරීමට ප්‍රථම ඉඩමේ අයිතිය නිරවුල් කර ගත යුතුව තිබුණි. | නිලසෙවන ඉදිකිරීම් කරගෙන යාමේදී වත්මන් විදුහල්පතිතුමා විසින් පාසලේ ඉදිරි සංවර්ධන කටයුතුවලට හා ආරක්ෂාවට අවහිරයක් වන බව දන්වා මෙම ඉදි කිරීම් නතර කරන ලෙස දන්වා තිබූ බැවින් මැනුම් වාර්තා ලැබෙන තෙක් ඉදි කිරීම් කටයුතු නතර කර ඇති බව දන්වා තිබුණි. |

**(ඇ) සමෘද්ධි බැංකු සංගම් මගින් ක්‍රියාත්මක ණය වැඩසටහන්**

------------------------------------------

| | | |
|---|---|---|
| හික්කඩුව, යක්කලමුල්ල හා බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක් යටතේ පවතින සමෘද්ධි ප්‍රජා මූල බැංකු 13 ක් මගින් විවිධ ණය වැඩසටහන් යටතේ සමෘද්ධිලාභීන්ට එකතුව රු.2,728,101,685 ක ණය මුදලක් නිකුත් කර තිබුණි. එම ණය මුදල් වලින් රු.50,759,127 ක් කල්පසු වූ ණය ලෙස හඳුනාගෙන තිබුණු අතර රු.8,663,605 ක් බොල්ණය ලෙස හඳුනාගෙන තිබුණි. එම කල් පසුවූ ණය හා බොල්ණය අය කර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | කල් පසුවූ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට හා බොල්ණය ශේෂය අවම කර ගැනීමට කාර්යක්ෂමව ක්‍රියා කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනෙහි 2019 දෙසැම්බර් 31 දිනට කල් පසු වූ ණය ශේෂය රු. 45,432,039 ක් දක්වා අඩු කර ගෙන ඇති බවත් බොල්ණය ශේෂය රු.8,353,345ක් දක්වා අඩු කර ගෙන ඇති බවත් දක්වා තිබුණි. තවද එම ණය අයකර ගැනීම සඳහා සමෘද්ධි බැංකු තුන මගින් පසු විපරම් කටයුතු කරන අතර, ක්ෂේත්‍ර නිලධාරීන් හා කළමණාකරු මගින් දැනුවත් කිරීම, පාලක මණ්ඩල සභාපති මගින් දැනුම් දීම, නිතිඥයින් |

| | | |
|---|---|---|
| | | මගින් ලිපි ඉදිරිපත් කිරිම, සමථ මණ්ඩලයට යොමු කිරීම හා සමථ නොවූ ණය කරුවන් අධිකරණයට යොමු කිරීම සිදු කර ඇති බවද තවදුරටත් දන්වා තිබුණි. |
| **(ඉ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්**<br>--------------------------------------------<br>(i) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉමදූව නිව්සිටි ජල ව්‍යාපෘතිය සඳහා 2019 මැයි 23 දින රු.990,000 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබිණි. මෙම ජල ව්‍යාපෘතියෙහි මූලික විමර්ශනය සහ ශක්‍යතා පරීක්ෂණය සඳහා 2019 මැයි 24 දින රු.48,875 ක් ගෙවා තිබුණි. ජල ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හා ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අතර 2019 ඔක්තෝබර් 29 දින අවබෝධතා ගිවිසුමකට ද එළඹී තිබුණි. එම ගිවිසුමට අනුව ව්‍යාපෘතියට අදාළ සියලු කටයුතු අවසන්කොට 2019 දෙසැම්බර් 15 දින වන විට ව්‍යාපෘතිය භාර දිය යුතුව තිබුණි. එහෙත් ප්‍රාදේශීය ලේකම් විසින් 2019 නොවැම්බර් 21 දින ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට රු.919,500 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කර ජනතාවට අවශ්‍ය පානීය ජලය ලබා දීමට පියවර ගත යුතු අතර ඒ සඳහා තවදුරටත් පසු විපරම් කටයුතු පුළුල් කළ යුතුය. | ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා II වන සිහිකැඳවීම් ලිපියක් යවන ලද බවත් එම ආයතනයෙන් මෙම ව්‍යාපෘතිය කඩිනමින් සිදු නොකිරීමට හේතු විමසීමක් කර ඇති බවත් දක්වා තිබුණි. තවද නල ළිඳ ඉදි කරමින් පවතින බවත්, ව්‍යාපෘතිය සඳහා පසු විපරම් කටයුතු සිදු කරමින් පවතින බවත් ව්‍යාපෘතිය කඩිනමින් නිම කර දීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ෂයේදී ආගමික ස්ථාන 14 කට සූර්යබල විදුලි පහසුකම් ලබාදීමට රාජ්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය රු.7,000,000 ක් වෙන්කර තිබුණි. මෙම ව්‍යාපෘතිය රු.5,600,000 ක් වූ නිපෝන් සෝලා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සමඟ ගිවිසුම්ගතව රු.2,000,000 ක් ගෙවා තිබුණි. ගිවිසුමෙහි 6,7,8 වගන්ති අනුව 2019 ඔක්තෝබර් 20 දින කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටද උක්ත සූර්ය බල පැනල සවි කරන ලද විහාරස්ථාන 14 ක් විදුලි බල පද්ධතියට සම්බන්ධ කිරීම (Grid connection) සිදු කර නොතිබුණි. ව්‍යාපෘතිය මාස 03 ක කාලයක් ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව අය කළ යුතු රු.280,000 ක ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි. | කරුණු පැහැදිලි කිරීමට අදාළ ලිපිය කඩිනමින් විගණනයට ඉදිරිපත් කළ යුතු අතර සූර්ය බල පද්ධතිය කඩිනමින් විදුලි බල පද්ධතියට සම්බන්ධ කළ යුතු බවට උපදෙස් ලබා දී ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. | හැකි ඉක්මනින් විදුලි සබඳතාවය ලබා ගැනීමට කටයුතු කරන බවත්, ගිවිසුමේ අංක 12 අනුව විදුලි සබඳතාවය ලබා දීමෙන් පසුව ගෙවනු ලබන සියයට 15 ක මුදල් මෙතෙක් ගෙවා නොමැති බවත් දන්වා තිබුණි. එමෙන්ම දෙපාර්ශවයේ පාලනයෙන් තොරව උද්ගතවූ හේතූන් මත ඇතිවූ ප්‍රමාදයක් බැවින් නියමිත ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට උපරිම උත්සාහයක් දැරීමට කටයුතු කරන බවත් විගණනයට දන්වා තිබුණි. |
| (iii) බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බද්දේගම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ ව්‍යාපෘතිය යටතේ කහඳූවවත්ත සිට පෝද්දල දක්වා මාර්ග කොටස සඳහා ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් ඉඩම් කැබලි 578 ක් තෝරාගෙන තිබුණු අතර අදාළ ඉඩම් ප්‍රමාණය | රජයේ තක්සේරුව මත ගෙවිය යුතු පොලිය ගණනය කර, මේ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශයෙන් කරුණු විමසා විගණනයට | මෙහිදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ ඉඩම් කොටස සඳහා ලබා දෙන තක්සේරු මුදල පමණක් මා විසින් ගෙවීමට කටයුතු කරන බව දන්වා තිබුණු අතර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, 38 (අ) අතුරු විධානය යටතේ කටයුතු කරන ලෙස මා වෙත කරනු |

| | | |
|---|---|---|
| හෙක්ටයාර් 5.4931 ක් විය. ඉඩම් අත්පත්කර ගැනීම් පනතේ 38 (අ) අතුරු විධාන ආඥාව නිකුත් නොකොට සාමාන්‍ය වන්දි ලබාදීමේ ක්‍රමය අනුගමනය කිරීමට හැකියාව තිබියදී හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා අත්පත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ඉඩම් අත්පත් කරගෙන තිබුණු බැවින් වන්දි ගෙවීම ප්‍රමාද වීම තුළ 2020 ජනවාරි 31 දිනට ඉඩම් හිමියන්ට ගෙවිය යුතු පොළිය ආසන්න වශයෙන් රු.217,162,882 ක් විය. | පිළිතුරක් ඉදිරිපත් කළ යුතුය. | ලබන නියමය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බවත් දන්වා තිබුණි. |
| (iv) බෝපේ-පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වක්වැල්ල සිට බීක්ක සේවා ජලාශය දක්වා පොම්පකරණ නළ මාර්ග එලීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේදී හිමිකරුවන් 11 දෙනෙකුට වන්දි ගෙවීමට හිමිකම් ලබා දී තිබුණි. වන්දි ගෙවීම සඳහා හිමිකම් පරීක්ෂණ 2017 අගෝස්තු 21 පවත්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ වන්දි ගෙවීමේ කටයුතු අවසන්කොට නොතිබුණි. ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය ආඥාව නිකුත් කර ඇති බැවින් අදාළ වන්දි මුදල සමග වන්දි චෙක්පත ලියන අවස්ථාව දක්වාම අදාළ පොලී මුදල් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2012 නොවැම්බර් 23 සිට වසර 07 කට අදාළ පොලී මුදල් ගෙවිය යුතුව තිබුණි. | වන්දි ගෙවීම ප්‍රමාද වීමට සාධාරණ හේතු විමසා ඌණතාවයන් සම්පූර්ණ කර වන්දි ගෙවීමේ කටයුතු අවසන්කළ යුතුය. | ඉඩම් කැබලි 11 සඳහාම තක්සේරු වාර්තා ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2020 මාර්තු 13 දින වන විට ඉදිරිපත් කරන ලද බවත් තක්සේරුව ලැබුණ වහාම වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කර ගොනුවේ කටයුතු අවසන් කිරීමට නියමිත බවත් දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (v) හික්කඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් දොඩන්දූව පොදු වෙළඳ පොල ඉදි කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාශය මගින් පටුවත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හෙක්ටයාර් 0.1709 ක් වන මාදරමුල්ල, කුඹුරුඹිවිට ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු 1999 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර ඉඩම අත්පත් කර ගැනීමට රුපියල් ලක්ෂ 20 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, ඉන් රුපියල් ලක්ෂ 5 ක් පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණි. ඉතිරි මුදල් නොගෙවීම මත වන්දි ගෙවීම ඇතුළුව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අතරමග නවතා දමා තිබුණි. | අදාළ පාර්ශවයන් දැනුවත් කර තක්සේරු කර ඇති මුදල් ගෙන්වාගෙන ඉඩම් අත්පත් කර ගැනීමේ අරමුණු කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. | ඉඩම අත්පත් කර ගැනීමට අදාළ තක්සේරුගත මුළු මුදල ඉල්ලුම්කාර අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර නොමැති බැවින් ගොනුවේ ඉදිරි කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. |
| (vi) හික්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මෝදර පටුවත ග්‍රාම නිලධාරී වසමට අයත් හෙක්ටයාර් 0.243 ක් වන පිඹුරුදෙණිය ඉඩම, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය මගින් ධීවර නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(ආ) අතුරු විධානය ප්‍රකාරව 1995 වර්ෂයේදී රජය සතු කර ගෙන මේ වන විට වසර 20කට ආසන්න කාලයක් වී තිබුණද, ඉහත අරමුණු ඉටු වී නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ අරමුණු වූ නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | උක්ත ඉඩම අත්පත් කර ගැනීමේ අරමුණ සඳහා භාවිතා නොවන බැවින් ගම් පුළුල් කිරීම යටතේ ඉඩම් නොමැති ජනතාව වෙත බෙදාදීම සඳහා නිර්දේශය 2019 සැප්තැම්බර් 09 දිනැතිව ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. ඉහත අත්පත්කර ගැනීමේ අරමුණ සංශෝධනය කිරීම සම්බන්ධයෙන් නිර්දේශය 2020 ජනවාරි 21 දිනැති ලිපිය මගින් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කර තිබුණද මෙතෙක් අමාත්‍යාංශය විසින් අත්පත් අරමුණ සංශෝධනය කර එවා නොමැති බව සඳහන් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (vii)හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කුමාර විදුහල පිහිටා තිබූ ඉඩම සංචාරක ප්‍රවර්ධන කාර්යයන් සඳහා රුහුණු සංචාරක කාර්යාංශය වෙත වසර 30 ක් සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීමට 2016 ජූලි 07 ලිපිය මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අනුමැතිය ලබා දී තිබුණි. රුහුණු සංචාරක කාර්යාංශය විසින් මෙම ඉඩම 2016 අප්‍රේල් 05 දින සිට වසර 30 ක කාලයක් සඳහා පෞද්ගලික ආයතනයකට අනුමැතියකින් තොරව උප බදු දී තිබුණි. බදු ගිවිසුම 2017 නොවැම්බර් 21 දිනැතිව ලියාපදිංචි කර තිබුණි. පෞද්ගලික ආයතනයකට ඉඩම උප බදු දීමෙන් ඉහත සංචාරක ප්‍රවර්ධන අරමුණු ඉටු නොවන බව අනාවරණය විය. | ඉඩම බදු දීමේ අරමුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විධිමත් අනුමැතියක් නොමැතිව රුහුණු සංචාරක කාර්යංශය බාහිර ආයතනයක් සමඟ අතිකරගත් ගිවිසුමක් මත සිදුකරන ලද ගණුදෙණුවක් බැවින් ඔවුන් ඉවත් කිරිම ගැටළු සහගත තත්වය ක් බැවින් ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබාදෙන ලෙස දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙතින් දෙවන අවස්ථාවටත් 2020 මාර්තු 12 දිනැති ලිපිය මගින් ඉල්ලා ඇති බව දන්වා තිබුණි. |
| (viii)රුහුණු සංචාරක කාර්යාංශය විසින් ඉඩමේ අයිතිය පැවරීම වෙනුවෙන් 2017 අගෝස්තු 30 දිනැතිව හික්කඩුව ප්‍රාදේශීය ලේකම් වෙත මුල් බදු වාරිකය වශයෙන් රු.320,000 ක් පමණක් ගෙවා තිබුණ ද, අතුරු බදුකරු විසින් රුහුණු සංචාරක කාර්යාංශය වෙත රු.350,000 බැගින් 2018 දෙසැම්බර් 31 දිනට මාස 10 ක් සඳහා රු.3,500,000 ක මුදලක් බදු මුදල් ලෙස ගෙවා තිබුණි. | හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමටත් අතුරු බදු දීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන විගණනයටද වාර්තා කළ යුතුය. | ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් 2019 ජූලි 24 දිනැති ලිපිය මඟින් මේ දක්වා පවතින සියළු හිඟ බදු මුදල් අය කර ගන්නා ලෙස දන්වා ඇති බවත් ඒ අනුව ආදාළ බදු මුදල් ගෙවන ලෙස රුහුණු සංචාරක කාර්යංශයට 2019 ජූලි 26 – 2019 අගෝස්තු 28 -2019 සැප්තැම්බර් 18 දිනැති ලිපි මගින් දන්වා ඇති බවත් විගණනයට දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| කාර්යාංශය විසින් හික්කඩුව ප්‍රාදේශීය ලේකම් වෙත බදු වාරික නොගෙවා ඉඩම තෙවන පාර්ශවයකට අතුරු බදු දී ආදායම් ඉපයීම රජයේ ඉඩම් අවභාවිත කිරීමක් ලෙස නිරීක්ෂණය විය. | | |

**(ඊ) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය**

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (i) ඉහත වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ පවතින නිරපේක්ෂ දරිද්‍රතාවය 2030 වන විට සම්පූර්ණයෙන්ම තුරන් කිරීම සඳහා දිළිඳුකම පිටුදැකීම මෙන්ම නිෂ්පාදනය වැඩිකර රැකියා අවස්ථා වැඩි කිරීම යන අරමුණු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් සඳහා පමණක් රු.35,636,139 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.21,617,131 ක් උපයෝජනය කර නොතිබුණි. 2017 වර්ෂයේදී ආරම්භ කළ මෙම වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු ආකාරය සම්බන්ධයෙන් නිසි උපදෙස් ලබා නොදීමත් වරින් වර චක්‍රලේඛ සංශෝධනය කිරීමත් හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක වීම මන්දගාමීව සිදුවී තිබුණි. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ආරම්භ කිරීමේ අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාගෙන ලැබී ඇති ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කර ගත යුතුය. | වැඩසටහන නොකඩවා සිදු කිරීමේ අරමුණින් ප්‍රතිපාදන නැවත හරවා යැවීම සිදු කර නොමැති බව දන්වා ඇති අතර අද වන විට ද නිසි උපදෙස් නොමැති බැවින් තැන්පත් කළ මුදල් බැංකු ගිණුම්වල පවතින බවත් දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ආරම්භ කර තිබුණු බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම ශක්ති ජනතා සමිති 03 ක 2019 දෙසැම්බර් 31දිනට රු.5,552,813 ක් බැංකුවේ තැන්පත් කර තිබුණු අතර මෙම වැඩසටහන ක්‍රියාත්මක නොවීම හේතුවෙන් රජයේ මුදල් කිසිදු ඵලදායී කාර්යයක යෙදවීමකින් තොරව නිශ්කාර්යව රඳවා තබා ගෙන තිබුණි. | සමිති ගිණුම්වල තැන්පත්කර ඇති මුදල් අදාළ අරමුණු සඳහා කාර්යක්ෂමව උපයෝජනය කරගෙන විගණනයට වාර්තා කළ යුතුය. | ග්‍රාම ශක්ති පුහුණු වැඩ සටහන් අවලංගු වීමෙන් පසුව මෙම වැඩ සටහන සඳහා, කිසිදු උපදෙසක් ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ලැබී නොමැති බවද තැන්පත් කළ මුදල් බැංකු ගිණුම්වල පවතින බවත් දන්වා තිබුණි. |
| (උ) **ගංවතුර, නාය යෑම් හා නාය යෑමේ අධි අවදානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කරන පවුල් නැවත පදිංචි කිරීමේ වැඩසටහන**<br>------------------------------------------- | | |
| ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ගංවතුර, නාය යෑම් හා නාය යෑමේ අධි අවදානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කරන පවුල් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යලයට 2017 ඔක්තෝබර් 26 දින රු.119,200,000ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණි. මෙම වැඩසටහන සඳහා ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ සංවිධානය මූලිකත්වයෙන් ප්‍රතිලාභීන් 28 දෙනෙකු තෝරාගෙන තිබුණු අතර එක් ප්‍රතිලාභියෙකුට උපරිම වශයෙන් රු.1,200,000 ක මුදලක් වෙන් කර තිබුණි. ප්‍රතිලාභීන්ට ගෙවිය යුතුව තිබුණු | සුදුසුකම් ලත් තාක්ෂණ නිලධාරියෙකුගේ සහතිකයක් ලබාගෙන උපදෙස් දී ඇති පරිදි වාරික මුදල් නිදහස් කළ යුතුය. | කොරෝනා වසංගතය යථා තත්ත්වයට පත් වූ පසු කාර්යාලයේ තාක්ෂණ නිලධාරී මගින් සහතිකයක් ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන බවද සඳහන් කර තිබුණි. |

IV වන වාරික මුදලින් රු.25,000 ක මුදලක් යෝග්‍යතා සහතිකය ලබා ගැනීමෙන් අනතුරුව ගෙවීම් කළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණු අතර ප්‍රතිලාභීන් 13 දෙනෙකු විසින් එම යෝග්‍යතා සහතික ලබා නොදීමෙන් එකතුව රු.325,000 ක් වූ මුදල් නිදහස් නොකර සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

## 2.4 තැන්පත් ශේෂයන්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුම් 04 කට අදාළව අවුරුදු 2 ත් 5 ත් අතර රු.81,444,468 ක් හා අවුරුදු 5ට වැඩි රු.180,031,698 ක ශේෂයන් නිරීක්ෂණය විය. ඉන් එක් පොදු තැන්පත් ගිණුමක රු.187,511,444 ක් වූ තැන්පතු මුදල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රදේශයේ මාර්ග කාපට් කිරීම් ව්‍යාපෘතිවල රඳවුම් මුදල් වී තිබුණි. එම ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. සතුටුදායක පරිදි මාර්ග කාපට් කිරීම් ව්‍යාපෘති ඉටු කර ඇති කර්මාන්තකරුවන්ගේ රඳවුම් මුදල් නිදහස් කිරීමටත් එසේ නොවන රඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිවලට අදාළ රඳවුම් මුදල් නිදහස් කිරීම සඳහා වැඩ නිම නොවූ මාර්ගවල වැඩ අවසන් කර අධීක්ෂණ ආයතනය වන දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදිය යුතු බවත් 2015 වර්ෂයේ සිට වැඩසටහන ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය අනුමැතිය හා ප්‍රතිපාදන නොමැතිකම නිසා මුදල් නිදහස් කිරිමට නොහැකි වී ඇති බවත් දන්වා තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණනයට ඉදිරිපත් කළ තොරතුරු ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් විසින් විවිධ සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවලින් 316 ක් නිම නොකර අත්හැර දමා තිබුණි. එම ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 141 ක් වී තිබුණි. | වර්ෂය තුළ උපයෝජනය කළ හැකි ප්‍රතිපාදන ප්‍රමාණය තීරණය කර ප්‍රමුඛතාවය ලබා දිය යුතු සංවර්ධන ව්‍යාපෘති හඳුනාගෙන ඒවා කාර්යක්ෂමව ඉටු කර රටේ සංවර්ධනයට දායකත්වය දීමට කටයුතු කළ යුතු අතර නිම නොකර අත්හැර දැමූ ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මැතිවරණ කොමිෂන් සභාවේ හා මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගිවිසුම්වලට එළඹ නොතිබුණු ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවීම, ව්‍යාපෘති සඳහා කිසිදු කොන්ත්‍රාත් සමිතියක් ඉදිරිපත් නොවීම, ගිවිසුම්ගත සමිති ව්‍යාපෘති අත්හැර දැමීම වැනි හේතු නිසා මෙම තත්ත්වය සිදුවී ඇති බව දන්වා තිබුණි. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හික්කඩුව, ගෝනාපීනුවල හා බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් එකතුව රු.මිලියන 11 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 16 ක් දින 60 සිට දින 90 ක අතර කාලයක් ප්‍රමාද වී තිබුණි. | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම, විධිමත් හේතු මත සාධාරණ කාලයක් විය යුතු අතර එසේ කාලය දීර්ඝ කිරීම විධිමත් පරිදි සිදු කළ යුතුය. කාලය දීර්ඝ කරගෙන නොමැති ව්‍යාපෘතිවලින් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කර ගත යුතුය. | අධික වර්ෂාව නිසා ප්‍රමාද වූ ඇතැම් ව්‍යාපෘතිවලින් ප්‍රමාද ගාස්තු අය කර ඇති බවත් ඇතැම් ව්‍යාපෘති ඉල්ලීම පරිදි කාලය දීර්ඝ කර ඇති බවත් ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘති ගුණාත්මක භාවය සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් සිදුවී නොමැති බවත් දන්වා තිබුණි. තවද ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබී නොතිබුණු ව්‍යාපෘති අවිච්ඡේද කර ඇති බවද දන්වා තිබුණි. |

## 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 කාර්යසාධන වාර්තාව අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ 2015, 2016 හා 2017 වර්ෂවල රැකියා නියුක්ත ප්‍රතිශතය පිළිවෙලින් සියයට 95 ක්, 94.9 ක් සහ 95.6 ක් වශයෙන් දක්වා තිබුණි. ගාල්ල දිස්ත්‍රික්කයේ සමෘද්ධි කාර්යාලයෙන් ලබා ගත් තොරතුරු අනුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 227,610 වී තිබුණි. දිස්ත්‍රික්කයේ මුළු ජන සංඛ්‍යාව 1,124,019 වූ අතර ජන සංඛ්‍යාවෙන් සියයට 20 ක ප්‍රතිශතයක් සමෘද්ධි ප්‍රතිලාභීන් වීමෙන් කාර්යසාධන වාර්තාවට අනුව රැකියා නියුක්ති ප්‍රතිශතය සියයට 95 ක් වශයෙන් දැක්වීම පිළිගැනීම අසීරු විය. | කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන බැවින් සංඛ්‍යාත්මක තොරතුරුවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් සහතික විය යුතුය. | 2018 දිස්ත්‍රික් කාර්ය සාධන වාර්තාවට 2015, 2016, 2017 වර්ෂවල ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයට අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ අදාළ සංඛ්‍යාත්මක තොරතුරු නිවැරදි ව ලබා දී ඇති බවත් දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් රැකියාවක නියුක්ත පුද්ගලයින් සංඛ්‍යාව ගණනය කළ විට සියයට 36 ට ආසන්න වන බවත් දන්වා තිබුණි. |
| (ආ) 2018 කාර්යසාධන වාර්තාව අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන හෝල් ඩී ගෝල් ශාලාවේ 2019 වර්ෂයේ ආදායම රු.3,425,529 ක් වී තිබුණද වර්ෂයේ වියදම දක්වා නොතිබුණි. | ආදායම හා වියදම සැසඳිය හැකි පරිදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. | 2018 වර්ෂයේ හෝල්ඩ් ගෝල් ශාලාවේ වියදම රු. 2,474,334 ක් බවත් කාර්යසාධන වාර්තාවේ ඇතුළත් වියයුතු කරුණු නිශ්චිතව සඳහන් කරමින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති ලිපිය පරිදි ඉදිරියේදි කටයුතු කරනු ලබන බවත් දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) කාර්යසාධන වාර්තාව අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් 2017 වර්ෂයේ රැස්කර තිබුණු මුළු ආදායම රු.200,323,098 ක් වී තිබුණි. නමුත්, 2018 වර්ෂයේ ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු.48,600,000 ක් වී තිබුණු අතර රැස්කර තිබුණු ආදායම රු.246,672,561 ක් වී තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායම සමඟ සැසඳීමේදී සියයට 508 ක වැඩිවීමක් බව නිරීක්ෂණය වූ අතර එසේ ආදායම් අඩුවෙන් ඇස්තමේන්තු කිරීමට සාධාරණ හේතු විගණනයට අනාවරණය නොකෙරුණි. | ආදායම් ශීර්ෂ 4 ක් සඳහා ආදායම් ඇස්තමේන්තු නොකර තිබීමට සාධාරණ හේතු කාර්යසාධන වාර්තාවේ සටහනක් මගින් පෙන්වා දිය යුතුය. | 20.03.02.03, 20.03.02.13, 20.03.02.14 හා 20.04.01.00 යන ආදායම් ශීර්ෂ හතර සඳහා ආදායම් ඇස්තමේන්තු කිරීමට උපදෙස් ලැබී නොමැති නිසා ඇස්තමේන්තු සකස් කර නොමැති බවත් රැස්කරන ලද ආදායමට ආදායම් ශීර්ෂ 07 හි ම ආදායම් ඇතුළත් කර ඇති නිසා රැස් කරන ලද ආදායම මෙලෙස ඇස්තමේන්තු ගත ආදායමට වඩා වැඩිවීමට හේතුවී ඇති බවද දන්වා තිබුණි. |
| (ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ආදායම් ශීර්ෂ 06 ක් යටතේ 2017 වර්ෂයේ හා 2018 වර්ෂයේ පිළිවෙලින් එකතුව රු.161,421,548 ක් හා රු.186,970,456 ක් රැස්කර තිබුණද, එම විෂයයන් වෙනුවෙන් 2018 වර්ෂයේ ආදායම ඇස්තමේන්තුකර නොතිබුණි. එයට හේතු විගණනයට අනාවරණය නොකෙරුණි. | ආදායම් ශීර්ෂ 4 ක් සඳහා ආදායම් ඇස්තමේන්තු නොකර තිබීමට සාධාරණ හේතු කාර්යසාධන වාර්තාවේ සටහනක් මගින් පෙන්වා දිය යුතුය. | ආදායම් ශීර්ෂ හතර සඳහා ආදායම් ඇස්තමේන්තු කිරීමට ආදායම් ගණන්දීමේ නිලධාරින් මඟින් උපදෙස් ලැබී නොමැති නිසා ඇස්තමේන්තු සකස් කර නොමැති නමුත් රැස්කරන ලද ආදායමට මෙම ඇස්තමේන්තු නොකරන ලද ආදායම් ශීර්ෂවලද ආදායම ඇතුළත්ව ඇති බවත් දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) 2018 කාර්යසාධන වාර්තාව අනුව ගාල්ල බටගන්විල හා තවලම සංචාරක බංගලා වෙනුවෙන් 2018 වර්ෂයේ පිළිවෙලින් රු.28,324,235ක් හා රු.128,611,862 ක් වියදම් දරා තිබුණි. ඒ අතුරින් බටගන්විල සංචාරක බංගලාව අළුත්වැඩියා වියදම රු.27,772,419 ක් හා තවලම සංචාරක බංගලාව අළුත්වැඩියා වියදම රු.128,105,907 ක් වී තිබුණි. එකී අළුත්වැඩියා වියදම තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. සංචාරක බංගලා දෙකෙහිම 2018 වර්ෂයේ ආදායම රු.264,900 ක් පමණක් වී තිබුණි. | කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති අතර නිවැරදි තොරතුරු ඇතුළත් නොකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. | කාර්ය සාධන වාර්තාවේ සඳහන් බටගන්විල හා තවලම සංචාරක බංගලාවේ 2018 වර්ෂයේ අලුත්වැඩියා වියදම ප්‍රමාද දෝෂයකින් ඇතුළත් වී ඇති බව දන්වා තිබුණි. |

**3.4 ප්‍රසම්පාදනයන්**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ---------- | -------------------------------------- |

| | | |
|---|---|---|
| (අ)(i) බටගන්විල දිසාපති නිල නිවස ඉදිකර තිබුණු භූමියේ සංරක්ෂණය උදෙසා ගේබියන් බැම්ම ඉදි කිරීමේ කර්මාන්තය කොටස් දෙකකට වෙන්කොට ප්‍රසම්පාදන කාර්යයන් දෙකක් ලෙස කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කර තිබුණි. 2019 මාර්තු 15 දින ඉහත කර්මාන්තයේ වැඩ අවසන් කර දිස්ත්‍රික් ලේකම් වෙත භාරදී තිබුණි. මෙම ප්‍රසම්පාදන කාර්යයන් ඉහළ සුදුසුකම් සහිත වඩා පලපුරුදු කොන්ත්‍රාත්කරුවන්ට නොපැවරීම, නිසි ප්‍රමිතියෙන් යුතු අමුද්‍රව්‍ය භාවිතා කොකිරීම, හා නුපුහුණු ශ්‍රමය භාවිතා කර තිබීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 24, 25 දිනවල ගේබියන් බැම්ම හානියට පත්වීම හේතුවෙන් රජයට රු. 7,690,295 ක පාඩුවක් සිදුවී තිබුණි. | පිළිතුරේ සඳහන් පරිදි මෙය වැඩි අවදානමක් සහිත කඩිනමින් ඉටුකළ යුතු ව්‍යාපෘතියක් බැවින් ගේබියන් බැම්ම ඉදි කිරීමට ප්‍රථම ස්ථානීය පරීක්ෂාවක් සිදුකර මෙවැනි හානියක් සිදු නොවන ආකාරයට අවශ්‍ය තාක්ෂණය භාවිතා කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. තවද නිසි ප්‍රමිතියෙන් යුතු අමුද්‍රව්‍ය භාවිතා නොකිරීම සම්බන්ධයෙන්ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙය වැඩි අවදානමක් සහිත කඩිනමින් ඉටුකළ යුතු ව්‍යාපෘතියක් බැවින්ද තනි ව්‍යාපෘතියක් ලෙස ඉටු කිරීමට වැඩි කාලයක් ගන්නා බැවින්ද ව්‍යාපෘති දෙකක් ලෙස මිල සැඳහුම් ක්‍රමයට ඉටු කරන ලද බව දන්වා තිබුණි. ව්‍යාපෘති දෙකෙහිම ඇස්තමේන්තුගත මුදල එකතු කළ විට රු.මි. 20 ඉක්ම නොයන බව ද දන්වා තිබුණි. තවද කොන්ත්‍රාත්තුව පවරා ඇති කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාහටම ඉහළ පලපුරුද්දක් ඇති බවත් එවැනි කොන්ත්‍රාත්කරුවන්හට පුහුණු ශ්‍රමිකයන් එකතුවක් පවතින බව දන්වා තිබුණි. තවද භාවිතා කළ අමුද්‍රව්‍ය වල ප්‍රමිතිය සම්බන්ධව විගණනය පෙන්වා දෙන ලද්දේ අතුරණ ලද කළු ගලේ ප්‍රමාණය සුළු වශයෙන් වැඩි වීමක් බවත් ප්‍රායෝගිකව ඉදිකිරීමේදී යොදා ගන්නා ලද ගලේ ප්‍රමාණය සුළු වශයෙන් වෙනස් විය හැකි බවත් මෙම ඉදිකිරීම Gravity Retaining Wall එකක් බැවින් ගලේ ප්‍රමාණය සුළු වශයෙන් වැඩි වීම එහි ස්ථායීතාවයට බලපෑමක් නැති බවත් තවදුරටත් දන්වා තිබුණි. ගේබියන් බැම්මේ පෙරලී ගිය මීටර් 13 ක පමණ දිග කොටසෙහි වටිනාකම රු.ලක්ෂ 9 කට ආසන්න මුදලක් වන බවත් එම හානියට පත් වූ කොටස නැවත යථා තත්ත්වයට පත් කර දෙන බව කොන්ත්‍රාත්කරු ලිඛිතව දන්වා ඇති බවත් තවදුරටත් දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) ඇස්තමේන්තු වටිනාකම වූ රු.7,690,295 ක වටිනාකමකට පවරා තිබුණු ඉහත ගේබියන් බැම්ම ඉදිකිරීමෙන් පසු හානියට පත්වීම සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | මෙවැනි සංරක්ෂණ ව්‍යාපෘති මගින් වර්ෂාවෙන් සිදුවන හානි වළක්වා ගැනීමක් අපේක්ෂා කරන අතර මෙමගින් එම අරමුණ ඉටු නොවී ඇති අතර රජයේ අරමුදල්වලට පාඩුවක් සිදු නොවන ආකාරයට කටයුතු කළ යුතුය. | හානියට පත් වූ ගේබියන් බැම්ම සම්බන්ධව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ( **NBRO)** මගින් වාර්තාවක් ලබා ගෙන ඇති බවත් එම වාර්තාවට අනුව ගේබියන් බැම්මේ කොටසක් 2019 ඔක්තෝබර් මස 24 , 25 දිනවල පැවති අධික වර්ෂාව නිසා කඩා වැටී ඇති බව සඳහන් කර ඇති අතර ඒ අනුව ගේබියන් බැම්ම යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරමින් පවතින බවත් දන්වා තිබුණි. |
| (iii) අනුමැතිය ලබාදීමේ ලිපියෙහි (Letter of Acceptance) තිබුණු අංක 6 පරිදි කර්මාන්තය නිම කර භාරදීමෙන් පසු මාස 12 ක් ආවරණය වන පරිදි මුළු කොන්ත්‍රාත් වටිනාකමට සියළු අවදානම් රක්ෂණයක් ලබා ගෙන තිබුණි. නමුත් එකී කාලය තුළ ගේබියන් බැම්ම හානියට පත්වීම නිසා සිදුවී තිබුණු අලාභය උක්ත රක්ෂණ ආවරණයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2020 අප්‍රේල් 30 දක්වාම ගේබියන් බැම්ම කොන්ත්‍රාත්කරුවන් ලවා නැවත සකස් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | රක්ෂණාවරණය මගින් අලාභය ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර තිබුණු බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර රක්ෂණාවරණය ලැබුණු පසු ඒබව ලිඛිත සාක්ෂි සහිතව විගණනයට දැන්විය යුතුය. | ගේබියන් බැම්ම ඉදිකිරීම සම්බන්ධව රක්ෂණාවරණය මගින් අලාභ ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කරමින් පවතින බවත් 2020 අප්‍රේල් 11 වන දින ගේබියන් බැම්ම යථා තත්ත්වයට පත් කිරීමට වැඩ ආරම්භ කළ බවත් දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | පස් වැර ගැන්නුම් සඳහා ටෙරා මෙෂ් භාවිතා කර තිබුණු අතර එය ව්‍යුහාත්මක නිර්මාණය සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් බව සඳහන් කර තිබුණි. නමුත් එවැනි ටෙරා මෙෂ් යොදා තිබුණු බවට තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් නොකෙරුණු බැවින් මේ සඳහා ගෙවා තිබුණු රු.1,018,604 ක මුදල වැඩියෙන් ගෙවීම් ලෙස නිරීක්ෂණය විය. | ඇස්තමේන්තුවල දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක Terra – mesh යොදා ඇති බවට භෞතික සාක්ෂි සමග විගණනයට පෙන්වා දිය යුතුය. | 2019 දෙසැම්බර් 03 වන දින විගණන නිළධාරීන් ගේබියන් බැම්ම පරික්ෂා කළ බවත් Terra – mesh ඉහළ සිට පළමු මට්ටමට යොදා ඉදිකර ඇති බව කාර්මික නිළධාරීන් පෙන්වා දී ඇති බවත් අවශ්‍ය නම් ඉතිරි මට්ටම් වල Terra – mesh යොදා ඇති බව පෙන්වා දිය හැකි බවත් දන්වා තිබුණි. |
| (ආ) (i) | ගංවතුරින් හා නායයෑම්වලින් හානියට පත් ප්‍රදේශවල “පුනරුත්ථාපන හා නැවත ඉදිකිරීම් කටයුතු” කඩිනම් කිරීම සම්බන්ධ චක්‍රලේඛය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ටෙන්ඩර් කැඳවීමකින් තොරව රු.මිලියන 50 ක් දක්වා කොන්ත්‍රාත් පැවරීමට බලය පවරා තිබුණි. ඒ යටතේ හදිසි ප්‍රසම්පාදන කාර්යයක් සේ සලකා යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පවත්වා තිබුණු පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අනුමැතිය ලබාගෙන තිබුණි. නමුත් පැරණි ගොඩනැගිල්ල ජලයෙන් යට නොවන බවත් එය හදිසි කාර්යයක් වශයෙන් පිළිගත නොහැකි | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි කටයුතු කළ යුතුය. | කාර්යාලයේ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් ගංවතුරින් පීඩාවට පත්වූ පවුල්වලට සහන සැපයීමේ ක්‍රියාවලියට දැඩි බාධාවන් ඇතිවූ බවත් කාර්යාලය තනි මහල්ව ඉතා අබලන් තත්ත්වයේ පැවතීමත් නිසා පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමටත් එම ස්ථානයේ ඒ වෙනුවට තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2017 අගෝස්තු 22 දාතමින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ චක්‍ර ලේඛ අංක MNPEA/04/2017 අනුව කටයුතු යොදන ලද බවත් දන්වා තිබුණි. ඒ අනුව මෙම කොන්ත්‍රාත්තුව ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් වෙත විවෘත ටෙන්ඩර් කැඳවීමකින් තොරව ප්‍රදානය කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම් වෙත පවරා තිබුණු බවත් ඒ අනුව කටයුතු කර ඇති බවත් තවදුරටත් දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | බවත් නිරීක්ෂණය විය. ඒ අනුව එම තත්ත්වය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 හි නියමයන්ගෙන් බැහැරව කටයුතු කිරීමක් වශයෙන් නිරීක්ෂණය විය. | | |
| (ii) | යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට 2018 ජනවාරි 18 දින ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබී තිබුණු අතර ඊට පෙර එනම් 2017 දෙසැම්බර් 30 දින මයුර කන්ස්ට්‍රක්ෂන් සමඟ රු.37,721,266 ක මුදලකට ගිවිසුම් ගතවීම හා 2017 දෙසැම්බර් 31 දින රු.7,544,253 ක අත්තිකාරම් මුදලක් චෙක්පතකින් ලබාදීම මඟින් මෙම කොන්ත්‍රාත්කරුට සැලසුම්සහගතව කොන්ත්‍රාත්තුව පැවරීමට කටයුතු සලසා තිබුණි. | ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට අනුමැතිය ලබා දීමේ ලිපියේ සත්‍ය පිටපතක් විගණනයට ඉදිරිපත් කළ යුතු අතර පිළිතුර පරිදි කටයුතු කර තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ අනුමැතිය ලබා දී ඇති ලිපිය 2017 දෙසැම්බර් 28 දින ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අත්සන් කර ඇති බවත් ඒ අනුව කොන්ත්‍රාත්තුව පැවරීම, ගිවිසුම් ගත වීම හා අත්තිකාරම් ලබා දීම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ අනුමැතිය ලද පසු සිදු කර ඇති බවත් දන්වා තිබුණි. |

## 3.5 වත්කම් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වාහන උපයෝජනය** | | |
| 2019 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 02 දින වන විට රිය අනතුරු 10 ක් සිදුවී තිබුණ අතර එකතුව රු.328,203 ක් වූ අලුත්වැඩියා වියදම් දරා තිබුණි. රු.254,420 ක් රක්ෂණ වන්දි ලැබී තිබුණි. එක් රථයක් 2019 නොවැම්බර් 14 දින අනතුරට ලක්වීම සම්බන්ධයෙන් අළුත්වැඩියා වියදම හෝ රක්ෂණ වන්දි ලැබීම් අනාවරණය නොකෙරුණු අතර තවත් රථයක අලුත්වැඩියා වියදම රු.25,800 ක් වී තිබුණද, ඒ සඳහා රක්ෂණ වන්දි ලැබුණේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් හා ලැබුණු රක්ෂණ වන්දි සම්බන්ධයෙන් ලොග් සටහන් පොතෙහි ඇතුළත් කර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරවද කටයුතු කළ යුතුය. | PD 6051 දරන රථය 2019 අගෝස්තු 13 දින අනතුරට පත්වී ඇති බවත්, මෙහි අළුත්වැඩියා වියදම රු.25,800 ක් බවත්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපර්රේෂන් ලිමිටඩ් වෙතින් රු.25,800 ක මුදල ගෙවා ඇති බවත් ගොනුවේ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වා තිබුණි.<br><br>හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක PC 5063 දරන රථය 2019 නොවැම්බර් 14 දින අනතුරට පත්ව ඇති බවත් එහි අළුත්වැඩියා වියදම රු.18,300 ක් බවත් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපර්රේෂන් ලිමිටඩ් වෙතින් රු.17,050 ක මුදලක් ගෙවා ඇති බවත් දන්වා තිබුණි. එහි වෙනස රු.1,250 ක් බවත් දන්වා තිබුණි. |
| **(ආ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්** | | |
| බෝපේ-පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටා තිබුණු ස්මාර්ට් ශ්‍රී ලංකා ප්‍රාදේශීය ඒකකයක් පිහිටුවා slieg.app පරිගණක මෘදුකාංගය හරහා රැකියා අපේක්ෂිතයන් | ස්මාර්ට් ශ්‍රී ලංකා වැඩසටහනෙහි අකාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක් කළ යුතු අතර පරිගණක යන්ත්‍ර | මෙම පරිගණක ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මිලට ගැනීමේ කටයුතු සිදුකර ඇති බැවින් වටිනාකම සම්බන්ධව මෙම කාර්යාලයට තොරතුරු වාර්තා වී නොමැති බව දන්වා තිබුණි. පුළුල් |

| | | |
|---|---|---|
| ලියාපදිංචි කිරීමට සැලසුම් කර ඒ පිළිබඳ අදාළ නිලධාරීන් පුහුණු කර තිබුණි. මෙම කටයුතු සිදු කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පරිගණක දෙකක් 2019 නොවැම්බර් 25 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී තිබුණි. පුළුල් අරමුණකින් ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතිය වෙනත් ආයතනයකට ලබා දෙන බව වාචිකව දන්වා අතරමඟ නවතා දමා තිබුණි. ලබා දී තිබූ පරිගණක දෙක නිශ්කාර්යව ගබඩාවේ රඳවා තබා තිබුණු අතර වටිනාකම විගණනයට අනාවරණය නොකෙරුණි. | වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | අරමුණකින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කළද, එම පරිගණක යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අන්තර්ජාල පහසුකම් හා අනෙකුත් උපකරණ මෙතෙක් ලැබී නොමැති බවත්, මෙම ව්‍යාපෘති සඳහා ලබා දෙන ලද පරිගණකවල අදාල මෘදුකාංග පවතින බැවින් නියමිත උපදෙස් ලැබෙන තුරු ආරක්ෂාකාරීව රඳවා තබාගන්නා ලද බවත් දන්වා තිබුණි. |

## 3.6 රජයේ නිලධාරීන්ගේ ඇප තැන්පතු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1971 වර්ෂයේ සිට 1991 වර්ෂය දක්වා ඇප තැන්පත් කළ නිලධාරීන් 35 කට අදාළ බැංකු පාස් පොත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තබාගෙන තිබුණි. මෙම ඇප තැන්පත් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට 2020 මැයි දක්වා ම අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අදාළ පාස්පොත් 35 සම්බන්ධයෙන්ද සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් එහි වර්තමාන ප්‍රගතිය විගණනයට දැන්වීමටත් කටයුතු කළ යුතුය. | 1971 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ඇප තැන්පත් කළ නිලධාරීන්ගේ බැංකු පාස් පොත් මෙම කාර්යාලය සතුව ඇති අතර එම පාස් පොත් අතරින් තොරතුරු සපයා ගත හැකි වූ සියළුම පාස් පොත් අදාල කාර්යාල වලට යැවීමට කටයුතු කළ අතර, තොරතුරු සොයා ගැනීමට නොහැකි වූ පාස්පොත් 35 ක් මේ දක්වා පවතින බව සඳහන් කර තිබුණි. |

## 3.7 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් උපකාර්යාල 02 ක් රත්ගම හා මාදම්පාගම ආරම්භ කර තිබුණු අතර 2019 ජුනි 30 වන විට ඒ සඳහා කාර්යාල කුලිය, විදුලිය ගාස්තු, ජල ගාස්තු, දුරකථන ගාස්තු,පිරිසිදු කිරීමේ වියදම්, ආරක්ෂක සේවා ගාස්තු, කාර්යාල විවෘත කිරීමේ වියදම්, ගොඩනැගිලි තුළ කාමර වෙන් කිරීම් වියදම හා වෙනත් වියදම් වශයෙන් එකතුව රු.8,326,225 ක් වූ වියදම් දරා තිබුණි. ගර්භනී කාන්තාවන් සඳහා පෝෂණ මුද්දර නිකුත් කිරීම හා ග්‍රාම නිලධාරී සහතික නිකුත් කිරීමේ කාර්යයන් පමණක් ඉහත ප්‍රාදේශීය කාර්යාල වලින් සිදුකර තිබුණු අතර වසර 03 කට ආසන්න කාලයක් සඳහා එකතුව රු. 8,326,225 ක් වැය කරමින් කාර්යාල පවත්වා එම කාර්යයන් පමණක් ඉටුකිරීම ආර්ථික නොවන හා ඵලදායී නොවන කටයුත්තක් ලෙස නිරීක්ෂණය විය. | ප්‍රාදේශිය ලේකම් උප කාර්යාල මගින් මේ දක්වා ප්‍රමාණවත් කාර්යභාරයක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර ගොඩනැගිලි සඳහා ගෙවනු ලබන කුලියට සාපේක්ෂව මහජන සේවාවන්ද පුළුල් කළ යුතුව තිබුණි. | ගාල්ල දිස්ත්‍රික් ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි උප කාර්යාලවල සියළු අනුයුක්ත කිරීම් සිදු කරන ලද්දේ හික්කඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කාර්යය මණ්ඩල යටතේම බැවින් වැටුප් ගෙවීම සඳහා අමතර ප්‍රතිපාදන වැය වී නොමැති බව සඳහන් කර තිබුණි. තවද ග්‍රාම නිලධාරී වසම් 97කින් සමන්විත මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3ක් බවට පත් කිරීම සඳහා මේ වන විට අංක 2147/2018 හා 2019.10.29 දිනැති ගැසට් පත්‍රය නිකුත් කර ඇති බැවින් කාර්යය මණ්ඩල අනුමත වීමෙන් පසු නව ප්‍රාදේශීය ලෙකම් කාර්යාල ගොඩනැගිලි ඉදි කරන තෙක් මෙම ගොඩනැගිලි භාවිතා කර මහජනතාවට තම සේවාවන් පහසුවෙන් ඉටුකර ගැනීමට අවස්ථාව සලසා දි ඇති බව සඳහන් කර තිබුණි. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සුනාමි නිවාස හිමිකම්ලාභීන්හට 2004 දෙසැම්බර් 26 දින සිට විගණන දිනය වූ 2019 ජූලි 24 දක්වාම නිවාස හිමිකම් දීමනා පත්‍ර ලබාදී නොතිබුණු අවස්ථා 64 ක් අනාවරණය විය. | විගණන දිනය දක්වාම දීමනා පත්‍ර ලබා දී නොතිබුණු අවස්ථා 64 සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | 2004 දෙසැම්බර් 26 දින සිට විගණන දිනය දක්වා මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් හිමිකම් දීමනා පත්‍ර ලබා නොදුන් ප්‍රතිලාභීන් 64 ට අදාළව ඇතැම් දීමනා පත්‍ර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමුකර ඇති බවත්, ඇතැම් දීමනා පත්‍ර නිකුත් කර ඇති බවත් තවත් කොටසක් නිවාස විකුණා ඇති බවත් පිළිතුරු වශයෙන් ඉදිරිපත් කර තිබුණි. |
| (ආ) දීමනා පත්‍රයේ උපලේඛන II අනුව "නිදහස් දීමනාවක් වශයෙන් පවරා දෙනු ලබන මෙකී ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ප්‍රදානය කරන ලද දින සිට වර්ෂ දහයක් ගතවන තෙක් ඉඩම් ලාභීයාගේ දරුවන් හෝ ලේ ඥාතීන්ගෙන් පරිබාහිර පුද්ගලයෙකුට, අතුරු බදු දීම, හෝ වෙනත් කිසියම් ආකාරයකින් අන්සතු කිරීම නොකළ යුතු අතර, ඉඩම් පදිංචිය සඳහාම යෙදවිය යුතුව තිබුණි. තවද එකී කාලසීමාව අවසන් වීමට මත්තෙන් පදිංචිය සඳහා නොයොදවන ලද්දේ | නිවාස අන්සතු කිරීම සම්බන්ධයෙන් දීමනා පත්‍රයේ උපලේඛන II පරිදි කටයුතු කළ යුතුය. | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් හා ජනාධිපති ලේකම් වෙතින් උපදෙස් විමසීම් කර ඇති බවත්, දීර්ඝ කාලයක් නොවිසඳුනු ඉඩම් ගැටළු පිළිබඳ ආයතන ප්‍රධානීන් හා පැවත්වෙන සාකච්ඡාවකට අදාළව තොරතුරු ලබා දෙන ලෙස දකුණු පළාත් ඉඩම් කොමසාරිස් කළ ඉල්ලීමට අනුව මෙම කොට්ඨාශයේ සුනාමී හිමිකම් දීමනා පත්‍ර සැකසීමේදී මතුව ඇති ගැටළු පිළිබඳව 2020 ජනවාරි 27 දිනැති ලිපිය යොමුකර ඇති බවත් දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | නම් හෝ එදින සිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට කිසිම බැඳීමකින් තොරව පෙරලා පැවරෙනු ඇත" යනුවෙන්ද සඳහන් වී තිබුණි. එසේ වූ නමුත් මෙම වගන්ති උල්ලංඝනය කර දීමනා පත්‍ර ලබාදීමට පෙර නිවාස අන්සතු කිරීම් 164 ක් නිරීක්ෂණය විය. ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම දීමනා පත්‍ර ලාභීන්හට දීමනා පත්‍ර ලබා නොදීම හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ඇ) | දීමනා පත්‍ර ලාභියා මියගිය අවස්ථාවල අනුප්‍රාප්තිකයන් සඳහා දීමනා පත්‍ර ලබා දී නොතිබුණු අවස්ථා 16 ක් නිරීක්ෂණය විය. | මිය ගොස් ඇති පුද්ගලයන්ගේ අනුප්‍රාප්තිකයන්ගේ නමින් හෝ වෙනත් සුදුසු ආකාරයකට දීමනා පත්‍ර ලබාදී නොතිබුණු අවස්ථා සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු අවසන් කිරීමට ක්‍රියා කළ යුතුය. | දීමනාපත්‍රලාභියා මියගිය අවස්ථා 16 ට අදාළව කොටසක් අනුප්‍රප්තිකයකුගේ නමින් දීමනා පත්‍රය සකස් කිරීමට කටයුතු කරන බවත්, ඇතැම් දීමනා පත්‍ර සකස් කිරීමට ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇති බවත්, එක් දීමනාපත්‍රයක් සම්බන්ධයෙන් පවුලේ එකඟතාවයක් නොමැති බවත් දන්වා තිබුණි. |
| (ඈ) | සුනාමි නිවාස 5 ක අනවසරයෙන් පදිංචි වී සිටි අවස්ථා නිරීක්ෂණය වූ අතර විගණන දිනය දක්වාම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාළ පාර්ශවයන්ගෙන් කඩිනමින් විසඳුමක් ලබාගෙන අනවසරකරුවන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය | මෙහි අනවසරකරුවන් ලෙස පදිංචිව සිටිනුයේ සුනාමි ප්‍රතිලාභීන් විසින් වෙනත් පාර්ශවයකට නිත්‍යානුකූල නොවන ආකාරයෙන් බැහැර කර ඇති නිවාස වන බවත් |

| | | |
|---|---|---|
| | | අනවසරකරුවන් සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්, පළාත් ඉඩම් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් ජනරාල් සමග අවස්ථා ගණනාවකම සාකච්ඡා පවත්වා ඇති බවත් ඒ සඳහා රජය මැදිහත්ව ප්‍රතිපත්තිමය තීරණයක් ලබා දෙන බව 2019 සැප්තැම්බර් 30 දිනැති ලිපිය මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් දන්වා ඇති බවත් පිළිතුරු වශයෙන් ඉදිරිපත් කර තිබුණි. |
| (ඉ) එක් ප්‍රතිලාභියකුට 3598 මු.පි.ගා.අංකය යටතේ නිවාස අංක 250 හා 251 යන නිවාස දෙකක් ලබා දී තිබූ අතර විගණන දිනය වන විට නිවාස දෙකම විකුණා තිබුණි. | නිවාස අන්සතු කිරීම සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියාකළ යුතුය. | මෙවැනි ආකාරයට අන්සතු කර ඇති ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ලබා දෙන බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් දන්වා එවා ඇති බව විගණනයට දක්වා තිබුණි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

----------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ---------- | ------------------------------------- |
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු 161 ක් පැවත තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු කර නොතිබුණි. | ස්ථිර නිලධාරීන් පත්කර පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු සඳහා ස්ථිර නිලධාරීන් පත් කරන තෙක් විධිමත් පරිදි වැඩ බැලීමේ නිලධාරීන් පත් කිරීමට හා රාජකාරි ආවරණය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 37 ක් බඳවාගෙන තිබුණි. | තනතුරු සඳහා බඳවා ගැනීමේදී අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා නොයන පරිදි ක්‍රියා කළ යුතුය | අතිරික්ත නිලධාරීන් 37 න් 21 ක් තොරුතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් වන බවත් අප විසින් මෙම කිසිදු නිලධාරියෙකුගේ අතිරික්තයක් ඇති කිරීමට කටයුතු කර නැති නමුත් එම නිලධාරීන්ගේ පෞද්ගලික ගැටළු හා දුෂ්කරතා මත කළ විවිධ අභියාචනා අනුව පත්වීම් බලධාරියා විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ කාර්යාල වලට අනුයුක්ත කර ඇති බවත් මෙම අතිරික්තය පිළිබඳව කිහිප විටකදීම පත්වීම් බලධාරියා දැනුවත් කර ලිපි යොමු කර ඇති බවත් දන්වා තිබුණි. |
| (ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව රියදුරන් 13 දෙනෙකු රාජකාරිවල නියුක්තව සිට තිබුණද, ධාවන තත්ත්වයේ පවතින සංචිත හා අනුයුක්ත වාහන 8 ක් පමණක් පැවතිණි. ඒ අනුව රියදුරන් පස්දෙනෙකුගේ අතිරික්තයක් පැවති අතර එකී රියදුරන්ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කළ දිනයේ සිට 2019 දෙසැම්බර් දක්වා රු.1,519,709 ක මුදලක් වැටුප් ගෙවා තිබුණි. එම මුදල අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය වූ අතර රියදුරන් පස්දෙනෙකු ඌණ උපයෝජිතව සිට තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් නොකළ යුතුය. | රියදුරන්ගේ ස්ථාන මාරු අභියාචනා සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගත් තීරණ මෙතෙක් ක්‍රියාකත්මක නොවීම හේතුවෙන් රියදුරු අතිරික්තය 05 ක් වූ බවත්, පසුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ඇති වූ පුරප්පාඩු අනුව රියදුරන් සිව්දෙනෙකු එම කාර්යාල වෙත අනුයුක්ත කර ඇති අතර දැනට පවතින්නේ එක් රියදුරකුගේ අතිරික්තයක් පමණක් බවත් දන්වා තිබුණි. |